# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1841/9 - 2013 දෙසැම්බර් මස 18 වැනි බදාදා - 2013.12.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

වයඹ පළාතේ පළාත් සභාවට තේරී පත් වීම හේතු කොට ගෙන වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ට්‍රෙවින් ප්‍රනාන්දු නම් වූ සභිකයා අයත් වන එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට ඉහත කී, ආඥාපනතේ 65අ (2) වැනි වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන කරුණානායක ලියනගේ චමින්ද කුමාර කරුණානායක මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි ජයසිංහ ආරච්චිල්ලාගේ සමන්ත ප්‍රියලීල් ජයසිංහ වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ (2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, කරුණානායක ලියනගේ චමින්ද කුමාර කරුණානායක මහතා වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ජේ. ඒ. එස්. පී. ජයසිංහ,
තේරීම්භාර නිලධාරි,
වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව.

2013 දෙසැම්බර් මස 13 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
පුත්තලම.

01 - 86

1A - G 18731 — 180 (2013/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ පච්චිලයිපල්ලි ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරයේ පුරප්පාඩුවක් පිරවීම

මිය යාම හේතු කොට ගෙන පච්චිලයිපල්ලි ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

වයිරන් තියාගරාසා නම් වූ සභිකයා අයත් වන එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත්, ඒ පච්චිලයිපල්ලි ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට ඉහත කී, ආඥාපනතේ 65අ (2) වැනි වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන කන්දන් ඉරාසතුරෙයි මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

පච්චිලයිපල්ලි ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී සිවසුබ්‍රමනියම් අච්චුදන් වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ (2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, කන්දන් ඉරාසතුරෙයි මහතා පච්චිලයිපල්ලි ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එස්. අච්චුදන්,
තේරීම්භාර නිලධාරී,
පච්චිලයිපල්ලි ප්‍රාදේශීය සභාව.

2013 නොවැම්බර් මස 25 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
යාපනය.

01 - 87

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.